L

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2020-01-24 |
|---|---|---|---|

පැමිණිලිකරු : ඩී. පද්මලතා ලියනගේ මයා.
ගංගාරාමය පන්සල අසල.
යාපනය පාර. රඹෑව.

වගඋත්තරකරුවන් : 01. එන්.ඩබ්ලිව්.ඒ. ජයන්ත මයා.
විදුහල්පති.
රඹෑව මධ්‍ය මහා විද්‍යාලය.
රඹෑව.

02. පී.එච්.බී. උපුල් දෙණිය මයා
උපගුරු.
රඹෑව මධ්‍ය මහා විද්‍යාලය.
රඹෑව.

<u>පැමිණිලි අංකය : ***HRC/AP/535/2017(S)***</u>

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තම පුතා වන චානුක සඳරුවන් ජයරත්න යන අය රඹෑව මහ විදුහලේ 12 වන වසරේ *F* පන්තියේ ඉගෙනුම ලබන බවත්ය. 2017.11.06 දින, පංති කාල සටහනේ නිදහස් පංති වේලාවක (Free Period) තවත් ළමුන් කිහිප දෙනෙකු සමග පන්තියේ සිටින අවස්ථාවේදී, චින්තක නැමති ගුරුවරයා විසින් ළමුන්ට අවවාද කර නැවත පන්තියට යවා ඇති බවත්, චින්තක නැමති ගුරුවරයාගේ අවවාද කිරීමෙන් පසු විදුහල්පතිවරයා විසින් තම දරුවාද ඇතුළුව ළමුන් 06 දෙනකුගේ පන්ති තහනම් කර ඇති බවත්ය.

පසුදින එනම්, 2017.11.07 වන දින දරුවා සාමාන්‍ය පරිදි පාසල් ගිය බවත් එදින වගඋත්තරකාර විදුහල්පති විසින් දරුවාව පාසල ඉදිරිපිට බෝමළුව අසල සිටුවා සිසුන් හා පාසලේ ගුරු මඩුල්ලටද මාර්ගයේ ගමන් ගන්නා අයටද පෙනෙන පරිදි මරණ බවට තර්ජන කරමින් වේවැලකින් අමානුෂික



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.cor
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලෙස පහරදෙමින් පාසලෙන් එලවා දමා ඇති බවත්, තම දරුවා සිය පාසල් බෑගය ඉල්ලා සිටීමේදී උපුල්දෙණිය නැමැති ගුරුවරයා එම ස්ථානයට පැමිණ තම පුතාට පරුෂ වචනයෙන් බැන වැදී ඇති බවත්, එම අවස්ථාවේදී තම දරුවාද පරුෂ වචන සඳහා ප්‍රතිචාර දක්වා ඇති බවත් සඳහන් කර ඇත.

එම අවස්ථාවේදී උපුල්දෙණිය ගුරුවරයා විසින් තම දරුවාට පහරදීම සඳහා දරුවා පසුපස පන්නා ගෙන පැමිණ ඇති බවත්, ඒ අනුව දරුවා නිවසට පැමිණ ලොකු සර් තමන්ට පහරදුන් බවට දන්වන ලද බවත්, එම අවස්ථාවේදී දරුවාගේ ශරීරයේ තුවාලද තිබූ බවත් සඳහන් කර ඇත.

පසුව විදුහල්පතිවරයා දුරකථනයෙන් තමාට කතා කර දරුවා පාසලෙන් පැන ආ බව දැන්වූ අතර, පසුව පැමිණිලිකාරිය හා ස්වාමි පුරුෂයා පාසලට ගොස් විදුහල්පති හමු වූ බවට සඳහන් කර ඇති අතර දරුවාට සිදුකල පහරදීම සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල්ගත නොවූ බවට දක්වා ඇත. අනතුරුව දරුවාගේ තුවාල සුව වී පාසලට ගිය පසු දරුවා භාර ගැනීම විදුහල්පති විසින් ප්‍රතික්ෂේප කළ බවද දක්වා ඇත.

අගතියට පත් දරුවා වන චානුක සඳරුවන් යන අයගේ ප්‍රකාශය :-

මෙම දරුවා විසින් 2017.11.07 වන දින සිදුවූ සිදුවීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, 2017.11.07 වන දින පාසලේ විවේක කාලයේ පාසලේ මිදුලේ සිටියදී විදුහල්පතිතුමා පැමිණ තමාට බැන වදිමින් රැවුල කපාගෙන එන ලෙසට පවසමින් වේවැලකින් පාරවල් 06ක් පමණ අත්වලට හා පිටට ගැසූ බවය. ඒ අනුව පාසල ඉදිරිපිට බාබර් සාප්පුවට ගිය නමුත් කපන්න රැවුල නොමැති බවද පවසා පසුව බාබර් විසින් රැවුල කපන ලද බවත්, පසුව නැවත පැමිණ පන්තියට ගිය අතර භූ ගෝලය උගන්වන ගුරුතුමිය පන්තියේ උගන්වමින් සිටි බවත් එහිදී ඇය විසින් "ලොකු සර්ට තරහ ගිහින් ඉන්නේ, ගෙදර යන්න" යැයි පැවසූ අතර තම බෑගය පන්තියේ නොමැති බව දැනගත් බවත් සඳහන් කර ඇත.

බෑගය ගැනීම සඳහා නැවත පැමිණෙන විට උපුල්දෙණිය ගුරුවරයා හමු වූ අතර එම ගුරුවරයාගෙන් තම බෑගය පිළිබඳව විමසූ විට තම බෑගය විදුහල්පතිතුමා ළඟ ඇති බවත් එය ගැනීමට පසුව පැමිණෙන ලෙස පැවසූ බවත් සඳහන් කර ඇත.

එමෙන්ම ප්‍රගීත් නැමති නියෝජ්‍ය විදුහල්පති හා උපුල්දෙණිය ගුරුවරයා විසින්ද තමාට ගෙදර යන ලෙසට පවසා උපුල්දෙණිය ගුරුවරයා විසින් තම මවට පරුෂ වචනයෙන් බැන වැදුනු බවත්, අම්මට පරුෂ වචනයෙන් බනින විට තමා විසින් කකුල පොළවට තදකළ අතර එවිට උපුල්දෙණිය ගුරුවරයා විසින් තමන්ට පහර දීමට සැරසී තමන්ව පාසලෙන් එලවා දැමූ බවත්ය.

වගඋත්තරකාර විදුහල්පතිවරයාගේ ප්‍රකාශය :-

2018.01.24 දින කොමිෂන් සභාවේදී පැවති පරීක්ෂණයේදී වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, 2017.11.07 දින තමා සේවයට පැමිණි බවත්, පෙ.ව.8.40ට පමණ උදෑසන පංති අධීක්ෂණ කටයුතු ආරම්භ කළ බවත්,

තම අධීක්ෂණයේදී මෙම දරුවා සහ තවත් දරුවන් පාසලේ ගුරුවරුන් වන චින්තක සහ උපුල්දෙණිය යන ගුරුවරු සමඟ පාසලේ ප්‍රධාන ගේට්ටුව අසල මිදුලේ සිටිනවා දුටු බවත්, තමන් එම ස්ථානයෙන් 6 වසර පන්තියේ අධීක්ෂණය සඳහා ගිය බවත්ය. එම අවස්ථාවේදී මෙම දරුවා දුටු අතර ඔහු රැවුල වවාගෙන සිටිනු දුටු බවත්, එම අවස්ථාවේදී දරුවාට වේවැලකින් පහරක් ගැසීමට සැරසුණු නමුත් දරුවාට පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත.

මෙම දරුවා රැවුල කපා ගැනීම සඳහා පාසල ඉදිරිපිට සැලූන් එකට ගිය බවත්, රැවුල කපාගෙන නැවත පාසලට පැමිණ ඇති බවත් සඳහන් කර ඇති අතර. කිසිදු අවස්ථාවක මෙම දරුවාගේ පන්ති තහනමක් සිදුකර නොමැති බවත්. එමෙන්ම මෙම පැමිණිලිකාරියට හෝ ඇයගේ ස්වාමි පුරුෂයාට පාසල තුළදී බැන වැදීමක් කර නොමැති බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකාර පී.එච්.බී.උපුල්දෙණිය ගුරු මහතාගේ ප්‍රකාශය :-

ඉහත වගඋත්තරකරු විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. 2017.11.07 වන දින දෙවන කාල පරිච්ඡේදය තමන්ගේ විවේක කාල පරිච්ඡේදයක් වූ බවත්. එම අවස්ථාවේදී තේ පානය කර පුස්තකාලය දෙසට යන විට පැමිණිල්ලේ නම් සඳහන් චානුක දරුවා මිදුලේ සිටිනු දුටු බවත්, මෙම දරුවා කකුලට ඉතා තද වූ කලිසමක් හැද රැවුලද වවාගෙන සිටි බවත්. ඒ අනුව තමන් මෙම දරුවා කැඳවා රැවුල කපා ගන්නා ලෙසටත්, නොගැලපෙන සපත්තු පාසලට නොපළදින ලෙසටත්, පාසලට ගැලපෙන ලෙසට කලිසම හදා ගන්නා ලෙසටත් දරුවාට උපදෙස් ලබා දුන් බවය.

මෙම අවස්ථාවේදී නියෝජ්‍ය විදුහල්පති බී.පී.පී. හේවාමාන්නගේ මහතාද එම ස්ථානය වෙත පැමිණි බවත්, විදුහල්පතිතුමා දරුවා දැක "මෙහෙමද පාසල් එන්නේ" කියා විමසූ බවත් එවිට දරුවා ගුරුවරුන් දෙස තර්ජණාත්මක ස්වරූපයෙන් බැලූ බවත්, එවිට පාසල ඉදිරිපිට ඇති බාබර් සාප්පුවට ගොස් රැවුල කපාගෙන එන ලෙසට විදුහල්පතිවරයා විසින් දන්වන ලද බවත්. ඒ අනුව දරුවා පාසලෙන් පිටතට ගිය බවත්. අනතුරුව මෙම දරුවාගේ පාසල් පොත් බෑගය පන්ති කාමරයේ සිට විදුහල්පතිතුමාගේ කාමරය වෙත රැගෙන ආ බවත් සඳහන් කර ඇත.

දරුවා රැවුල කපාගෙන පැමිණි පසුව ඔහුගේ පාසල් බෑගය පිළිබඳ ප්‍රශ්න කළ විට බෑගය විදුහල්පති භාරයේ ඇති බව තමා විසින් දරුවාට දැන්වූ පසු දරුවා ගෙදර යාමට සැරසුණු නමුත් ගුරුවරුන් එයට ඉඩ නොදීම හේතුවෙන් දරුවා ගුරුවරුන්ට පරුෂ වචනයෙන් බැන වැදී පාසල් ගේට්ටුවෙන් එළියට ගිය අතර. ඔහු නැවත පාසලට නොපැමිණි බවත් සඳහන් කර ඇත.

තමන් කිසිදු අවස්ථාවක දරුවාට බැන වැදීමක් නොකල අතර. දරුවාට කිසිදු පහරදීමක් නොකල බවත් එමෙන්ම කිසිදු ගුරුවරයෙකු ඔහුට පහර නොදුන් බවත් සඳහන් කර ඇති අතර, මෙම දරුවාගේ විනය

හා හැසිරීම පාසලට නුසුදුසු හැසිරීමක් වන අතර ඔහුගේ විනය පිළිබඳව විවිධ අවස්ථාවලදී උපදෙස් හා අවවාද ලබාදී ඇති බවත්, තමන් ගුරුවරයෙකු ලෙස පාසලේ දරුවන්ගේ විනය හා හැසිරීම පොදුවේ ආරක්ෂා කිරීමට කටයුතු කරන බවත්, පාසලේ සෑම දරුවෙකු කෙරෙහිම අවධානය යොමු කරනු ලබන බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය :-**

පැමිණිල්ල අනුව පැමිණිලිකාරියගේ දරුවා අ/රඹෑව මධ්‍ය මහා විද්‍යාලයේ 12 වන වසරේ *F* පන්තියේ ඉගෙනුම ලබන අයෙකු වන අතර, මෙම දරුවා 2017.11.07 වන දින පාසලේ මිදුලේ සිටියදී පාසලට නුසුදුසු ලෙස රැවුල වවාගෙන සිටීම හා කකුලට තද වූ කලිසමක් හැද සිටීම නිසා අවවාද කළ බවට හා වේවැලකින් පහරදීමට තැත් කළ බවට 2018.01.24 දිනැති පරීක්ෂණයේදී 1 වන සහ 2 වන වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව හමුවේ පිළිගෙන ඇත.

වගඋත්තරකරුවන් ප්‍රධාන වශයෙන් ප්‍රකාශ කර ඇත්තේ, මෙම දරුවාගේ විනය කරුණක් හේතුකොටගෙන දරුවාට උපදෙස් ලබාදී දරුවාට අවවාද කළ බවත්, වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන පරිදි දරුවා පාසල තුළ විනය කඩවන ලෙසට කටයුතු කර තිබුණේ නම් ඒ සම්බන්ධයෙන් 12/2016 චක්‍ර ලේඛනයේ සඳහන් කරුණු ප්‍රකාරව දරුවාව විනය මණ්ඩලයක් වෙත පමුණුවා නිසි ක්‍රමවේදය අනුව දරුවා සම්බන්ධයෙන් විනය කටයුතු කිරීමට විදුහල්පති වෙත හැකියාව තිබුණි. නමුත් විදුහල්පති විසින් දරුවාගේ විනය පිළිබඳව නිසි ක්‍රමවේදය තුළ කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

එමෙන්ම දරුවාගේ විනය විරෝධී කටයුත්ත පිළිබඳව විදුහල්පති විසින් හදිසි තීරණයක් ගෙන දරුවාව එම අවස්ථාවේදීම එනම් පාසල් කාලය තුල භාරකරුවෙකු නොමැතිව පාසලෙන් පිටතට යවා ඇති බවද නිරීක්ෂණය වන අතර, එමඟින් දරුවාගේ ආරක්ෂාව පිළිබඳව විදුහල්පති විසින් කිසිදු සැලකිල්ලක් දක්වා නොමැති බවද නිරීක්ෂණය වේ.

ගුරුවරුන් යනු ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් (loco-Parent's) නම් වූ නීතිමය සංකල්පයට අනුව ශිෂ්‍යයින්ගේ සුභසිද්ධියට හේතුවන අයුරින් කටයුතු කිරීමට සෑම ගුරුවරයෙකුම බැඳී සිටියි. එසේම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කළ 2012/37 චක්‍රලේඛනයේ ගුරුවරුන්ගේ සාදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය හා පොදු නීතිමාලාවන් දක්වා ඇති අතර, එහිදී කරුණු 08 ක් ඔස්සේ අදාළ ආචාර ධර්ම පද්ධති දක්වා ඇත.

තවද <u>බණ්ඩාර එදිරිව වික්‍රමසිංහ</u> 1995 2 SLR 167 නඩුවේදී ප්‍රකාශ වී ඇත්තේ, දරුවන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම ගුරුවරුන්ගේ විෂය පථයට අයත් වන්නක් බවත්, එම විනය පවත්වාගැනීමේ අදහසින් ඔවුන් ගනු ලබන ක්‍රියාමාර්ග ඔවුන්ට පැවරී ඇති රාමුව තුළ බවත් ය. එම ක්‍රියාව තුළින් ඔවුන්ට පැවරී ඇති බලතල රාමුව ඉක්මවා යන්නේ නම්, එම විධායක හෝ පරිපාලනමය

ක්‍රියාමාර්ග මගින් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවන බැවින් එයට ඔවුන් වගකිව යුතු බවත් දක්වා ඇත.

මෙම දරුවාට තමා විසින් වේවැලකින් පහරදීමට තැත්කළ බවට 2018.01.24 දිනැති පරීක්ෂණයේදී විදුහල්පතිවරයා විසින් පිළිගැනීම තුළින්ම යම් සිදුවීමක් සිදුවූ බවට කරුණු නිරීක්ෂණය වේ.

උපගුරු පී.එච්.බී.උපුල්දෙණිය විසින් චානුක සඳරුවන් යන දරුවාට තර්ජණය කිරීම හා විදුහල්පතිවරයා විසින් කරන ලද පහරදීම සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි තුනක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති අතර, එම සාක්ෂි මගින් විදුහල්පතිවරයා විසින් දරුවාට පහරදීමක් සිදුකර ඇති බවට සනාථ කර ඇත.

ඒ අනුව ඉහත සමස්ත කරුණු සලකා බැලීමේදී දරුවාගේ රැවුල, පැළඳි සපත්තු හා ඇඳුම් මුල් කරගෙන දරුවා සම්බන්ධයෙන් විදුහල්පති හා උපගුරුවරයෙකු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති ''කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකල යුත්තේය'' යන අයිතිවාසිකමද, එම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති " නීතිය පසිඳලීම හා ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන අයිතිවාසිකමද, එසේම එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි 37 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති "කිසිදු දරුවෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට ලක්නොවිය යුත්තේය" යන අයිතිවාසිකමද අගතියට පත් දරුවා සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. මෙහි වගඋත්තරකාර විදුහල්පති, එන්.ඩබ්.ඒ ජයන්ත මහතා ~~විසින්~~ සහ උපගුරු පී.එච්.බී උපුල් දෙණිය මහතා සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් අධ්‍යාපන අමාත්‍යංශය වෙත යොමු කරනු ලැබේ.

02. අධ්‍යාපන අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති අංක 12/2016 දරණ චක්‍රලේඛනයේ ශාරීරික දඬුවම් පිළිබඳව පමණක් අවධානයට ලක්කර ඇති නමුත් මානසික වධහිංසාව පිළිබඳවද චක්‍රලේඛනයට ඇතුළත් විය යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

03. පාසල් පද්ධති තුළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් සඳහා 2016/12 චක්‍රලේඛනය ඇතුළුව මූලික අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට ක්‍රම සම්පාදනය කර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කළයුතු බවටද ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2020.02.28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණි මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. ගරු අමාත්‍යතුමා.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

02. ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/